# ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (ගිණුම් පිළිබඳ නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමග කියැවෙන 9(2) වගන්තිය ප්‍රකාරව පනත යටතේ නිකුත් කළ 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් විසින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග) වල සඳහන් දෑ සහ පහත සඳහන් රෙගුලාසිවලට යටත්ව ආමුඛ ආයෝජන ගිණුම් (IIA) විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අවසර ලබා දෙනු ලැබේ.

2. **සුදුසුකම්ලත් පුද්ගලයන්**

ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කෙරේ.

3. **අවසරලත් බැර කිරීම්**

3.1 ආමුඛ ආයෝජන ගිණුම්වල අවසරලත් බැර කිරීම්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කෙරේ.

3.2 ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කර ඇති බැර කිරීම්වලට අමතරව ආමුඛ ආයෝජන ගිණුම් සඳහා සහ පහත සඳහන් බැර කිරීම් සඳහා ද අවසර ලබා දේ.

(අ) ලාභාංශ, විකුණුම් ඉපැයුම්, කොටස් නැවත ලබා ගැනීම් සහ අනේවාසික ආයෝජකයන් විසින් සපයන ලද පිරියත උපකරණ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින් නිකුත් කරන ලද සෑම පන්තියකම කොටස් වෙනුවෙන් ලැබෙන වෙනත් ඕනෑම ආදායමක්.

4. **අවසරලත් හර කිරීම්**

4.1 ආමුඛ ආයෝජන ගිණුම්වල අවසරලත් හර කිරීම්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කෙරේ.

4.2 ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කර ඇති හර කිරීම්වලට අමතරව/ ආමුඛ ආයෝජන ගිණුම් සඳහා පහත සඳහන් හර කිරීම් සඳහා ද අවසර ලබා දේ.

(අ) පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව ප්‍රදානය කර ඇති අවසරයන් යටතේ ණය ලබාගෙන ඇති අවස්ථාවක දී (ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රාග්ධන ගනුදෙනු සිදුකිරීමේ අරමුණින් ලබාගත් ණය හැර) එම ණය මුදල් (ණය සුරැකුම්පත්‍ර ඇතුළුව) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු විසින් (එනම් ණය ගැනුම්කරු) පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට මාරු කිරීම.

5 **වෙනත් කොන්දේසි**

5.1 ආමුඛ ආයෝජන ගිණුමක් අයිරාගත නොවිය යුතු අතර ආමුඛ ආයෝජන ගිණුම් හිමියෙකුහට ණය පහසුකම් ලබා නොදිය යුතුය.

5.2 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයේ 1(2) ඡේදයේ (ඇ), (ඊ), (උ) සහ (එ) උපඡේද හා 1(3) ඡේදයේ (ඇ), (ඉ) සහ (ඊ) උපඡේදයන්හි සඳහන් ගනුදෙනු සිදු කළ යුත්තේ ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන් යටතේ ප්‍රදානය කර ඇති පොදු අවසරය හා කලින් කලට නිකුත් කරනු ලබන නියෝගයන් සහ පනතේ 7 වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කෙරෙන විශේෂ අවසරයන් යටතේය.

5.3 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයේ 1(2) ඡේදයේ, (ඇ) උපඡේදය යටතේ අවසර දී ඇති ගනුදෙනු ක්‍රියාත්මක කරන අවස්ථාවේදී, ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග ක්‍රියාත්මක කිරීමේ දිනයට පූර්වයෙන්, නැවත නම් කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුම හරහා ආයෝජනය සිදු කර ඇති අවස්ථාවකදී ඊට අදාළ සියළු ආදායම් හා ආයෝජන ඉපැයීම් ආමුඛ ආයෝජන ගිණුමට බැර කරන බවට බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සනාථ කර ගත යුතුය.

5.4 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයේ, 1(2) ඡේදයේ, (ඊ) උපඡේදය යටතේ අවසර දී ඇති ගනුදෙනු ක්‍රියාත්මක කරන අවස්ථාවේදී අදාළ ණය ගැනුම්කරුවා විදේශ ව්‍යවහාර මුදල් ණය (ණය සුරැකුම්පත්‍ර ඇතුළුව) ලබාගෙන ඇත්තේ ප්‍රාග්ධන ගනුදෙනුව පිළිබඳ නියෝගයන් හෝ පනතේ ප්‍රතිපාදනයන් යටතේ ප්‍රදානය කෙරුනු විශේෂ අවසරයක් ප්‍රකාරව බවට බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සනාථ කර ගත යුතුය.

5.5 සිදු කිරීමට නියමිත පාදක වූ ගනුදෙනුවෙහි නීත්‍යානුකූලභාවය හා සද්භාවය තහවුරු කර ගැනීමට හා මෙම විධානයන්හි පනවා ඇති කොන්දේසි වලට අනුකූල බව තහවුරු කර ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු ලෙස බලයලත් වෙළෙඳුන් විසින් නෛතිකව පිළිගත හැකි මනා ලේඛනගත සාක්ෂි ලබා ගත යුතුය.

5.6 බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ව්‍යවස්ථාපිත තොරතුරු තබා ගැනීමේ කුමන හෝ අවශ්‍යතාවයන් ඉක්මවා යමින්, ආයෝජනය නිම වී වසර 6ක් ඉකුත් වනතුරු ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී ලබා ගන්නා ලද ලේඛනගත සාක්ෂි පවත්වා ගත යුතුය.

5.7 ආමුඛ ආයෝජන ගිණුමක් වසා දැමීම

අ. ගිණුම් හිමියා විසින් ආමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කළ සියළුම ආයෝජනයන් නිම කර ඇත්නම් පමණක් ආමුඛ ආයෝජන ගිණුම් වසා දැමිය හැක.

ආ. කෙසේ නමුත්, ආමුඛ ආයෝජන ගිණුම් හිමියකු විසින් එම ආමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කළ ආයෝජනයන් හමාර කිරීමට ප්‍රථම නව ආමුඛ ආයෝජන ගිණුමක් විවෘත කිරීමට හෝ වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමග නව ආමුඛ ආයෝජන ගිණුමකට මුදල් මාරු කිරීමේ අරමුණු සඳහා ආමුඛ ආයෝජන ගිණුම වැසීමට ඉල්ලීමක් කරන අවස්ථාවේදී, මුල් ආමුඛ ආයෝජන ගිණුම පවත්වාගෙන ගිය බලයලත් වෙළෙන්දා විසින්, ආමුඛ ආයෝජන ගිණුම පවත්වාගෙන යාමට

අදහස් කරන බලයලත් වෙළෙන්දා, වෙත ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි වසා දැමීමට ඇති ආමුඛ ආයෝජන ගිණුමේ ඇති මුදල්වලින් සිදු කරන ලද හා දැනට පවතින ආයෝජන පිළිබඳ තහවුරු කිරීමක් ඉදිරිපත් කළ යුතුය.

**6. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම.**

6.1 බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් https://www.cbsl.lk/forexnet හරහා දෛනිකව ආමුඛ ප්‍රේෂණ ගිණුම් විස්තර සැපයිය යුතුය.

6.2 ඉහතකී වාර්තා කිරීමේ අවශ්‍යතාවයට අනුව බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලයලත් වාණිජ බැංකුවක් අදාල බැංකුවෙහි ගිණුම් පොත් ඇසුරින් අදාල තොරතුරු උපුටා ගැනීමට හෝ ජනනය කිරීමට බැංකුව තුළ ක්‍රියා පිළිවෙතක් ක්‍රියාත්මක කළ යුතුය.

6.3 බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලයලත් වාණිජ බැංකුවක් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවට සපයන ලද විද්‍යුත් තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය එහි අභ්‍යන්තර විගණන, කාලර්තිත නිරීක්ෂණ සහ අනුකූලතා වැඩසටහන් තහවුරු කර ගත යුතු අතර, එකී සාක්ෂි විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙන් කරන පිරික්සුම් සඳහා සූදානමින් තැබිය යුතුය.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**